# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,270 — 1964 දෙසැම්බර් 28 වැනි සඳුද — 1964.12.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

එල්. ජී.—ජී. 17/55

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184(5) (අ) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලනය සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති, ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය, වන මම, එකී වගන්තිය යටතේ මාතර නගරය සම්බන්ධයෙන් පනවනු ලැබ, අංක 12,729 හා 1961 ඔක්තෝබර් 23 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනලද ආඥාව, එහි (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය, එනම්:—

"(ආ) ඒ ආඥාපනතෙහි විධිවිධාන යටතේ මාතර නගරය සඳහා අළුත් නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබ, ඒ සභාව විසින් ස්වකීය සභාපති පත්කරගන්නාතුරු, මාතර නගරයේ කටයුතු පරිපාලනය කිරීම පිණිසත් ඒ කාර්යය සඳහා එකී ආඥාපනත යටතේ නගර සභාවක බලතල පාවිච්චි කිරීම හා යුතුකම් ඉටුකිරීම පිණිසත්, සහකාර පළාත් පාලන කොමසාරිස්වර හෙව්ව් ආරච්චිගේ පියදාස අබේවර්ධන මහතා විශේෂ කොමසාරිස් වශයෙන් පත්කරමි."

යන්න ආදේශ කිරීමෙන් 1965 ජනවාරි 1 වැනි දින සිට මේ ආඥාවෙන් සංශෝධනය කරමි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1964. 12. 24,
කොළඹ දීය.

12-1269


ලංකාවේ වැලව්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලයේ නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණපිතයි

1217—ආර් 2868—4,775 (12/64)